සැ.යු.- 2017.03.10 දින පළවූ අංක 2010 දරන ගැසට් පත්‍රයේ III කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,011 - 2017 මාර්තු මස 17 වැනි සිකුරාදා - 2017.03.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 684 | පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 687 | අයවැය ලේඛන ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — | දේපළ විකිණීම් ... ... ... | — |
| | | විවිධ දැන්වීම් ... ... ... | 698 |


*සැ. යු.* -(i) සමස්ත ලංකා ඓතිහාසික දේවාලවල පාරම්පරික නිලධාරීන්ගේ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2017 පෙබරවාරි මස 23 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත 2017 මාර්තු මස 03 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි **ගැසට් පත්‍රය පළ වූ දින සිට** තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2017 අප්‍රේල් මස 07 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 මාර්තු මස 24 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු - ඇබෑර්තු

## දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව

දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් කේත අංකය | වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 01 | ක්ෂේත්‍ර පරිපාලක | 01 | MN 1 | රා.ප.ච. 3/2016 අනුව වැටුප රු. 27,140 - 300 x 10 - 350 x 11 - 495 x 10 - 600 x 10 - රු. 45,540 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 ii වැනි උපලේඛනය පරිදි වැටුප් ගෙවනු ලැබේ.<br>vii වැනි වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථය සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා/පෙළ) විභාගය සමත් වීම;<br>සහ<br>අ.පො.ස. (උ/පෙළ) විභාගයේදී අවම වශයෙන් එක් විෂයක්වත් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.<br>වෙනත් :<br>1. ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතු ය.<br>2. අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03 ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවකු විය යුතුය.<br>3. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.<br>අයදුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනට අවුරුදු 18ට නොඅඩු අවුරුදු 30ට නොවැඩි විය යුතු ය. |
| 02 | බර යන්ත්‍රෝපකරණ ක්‍රියාකරු | 01 | PL3 | රා.ප.ච. 3/2016 අනුව වැටුප රු. 25,790 - 270 x 10 - 300 x 10 - 330 x 10 - 350 x 12 - රු. 38,990 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 ii වැනි උපලේඛනය පරිදි වැටුප් ගෙවනු ලැබේ.<br>iv වැනි වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | අධ්‍යාපන සුදුසුකම් :<br>අ.පො.ස. (සා.පෙළ.) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් 06ක් සමත් වී තිබීම. (මින් විෂයයන් පහක් (05)එකවර සමත් විය යුතු ය.)<br>වෘත්තීය සුදුසුකම් :<br>1. බර වාහන රියැදුරු බලපත්‍රය (තාර බාර හොන්ඩර් 34ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් හා මගීන් 32ට වඩා ගෙන යා හැකි බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද නිපුනතාවය පිළිබඳ සහතිකයක් හෝ "ඒ" පන්තියේ බලපත්‍රයක් හෝ නව රියැදුරු බලපත්‍රය අනුව "ඩී" පන්තියේ බලපත්‍රයක්) ලබා තිබිය යුතුය. |

| අනු අංකය | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් කේත අංකය | වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|---|
| | | | | | 2. අවම උස අඩි 05ක් විය යුතු ය.<br>3. බර යන්ත්‍ර/ගල් රෝල් ක්‍රියාකරවීම පිළිබඳව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවෙන් නිකුත් කරන ලද NVQ 04 මට්ටම අදාළ සහතිකපතක් තිබිය යුතු ය.<br>4. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳව මූලික අවබෝධයක් තිබිය යුතු ය.<br>*පළපුරුද්ද :*<br>බර යන්ත්‍රෝපකරණ / ගල් රෝල් ක්‍රියාකරවීම පිළිබඳව එක් වසරක පළපුරුද්ද ලබා තිබීම.<br>*කායික සුදුසුකම් :*<br>සෑම අයදුම්කරුවෙකුම බස්නාහිර පළාතේ ඕනෑම දිස්ත්‍රික්කයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය. |
| 03 | ක්ෂේත්‍ර වැඩ කම්කරු | 02 | PL 01 | රා.ප.ච. 3/2016 අනුව වැටුප රු. 24,250 - 250 x 10 - 270 x 10 - 300 x 10 - 330 x 12 - රු. 36,410 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 03/2016 ii වැනි උපලේඛනය පරිදි වැටුප් ගෙවනු ලැබේ. iv වැනි වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | 8 වන ශ්‍රේණිය 9 වසර සමත්ව තිබිය යුතු ය. |

03. *අවශ්‍ය වෙනත් සුදුසුකම් :-*

I. අයදුම්පත්‍ර බාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතු ය. (දැනට රජයේ හෝ පළාත් පාලන රාජ්‍ය සේවයේ ස්ථිර සේවයේ අයට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)

II. අයදුම්කරු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු ය.

III. අයදුම්පත් කැඳවන දින වන විට අයදුම්කරු බස්නාහිර පළාතේ අවම වශයෙන් වසර තුනක ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය.

IV. දොඩන්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචි අයදුම්කරුවන් වෙනුවෙන් වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

V. විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතු ය.

VI. තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

VII. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතු ය.

VIII. රජයේ/පළාත් පාලන හෝ සංස්ථා සේවයෙන් පහකරනු ලැබූවකු නොවිය යුතු ය.

IX. දැනටමත් දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාවේ එම තනතුරුවල අනියම්, ආදේශක දීමනා මත කොන්ත්‍රාත් හෝ කුලී පදනම යටතේ සේවයේ නියුතු වූවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

04. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

I. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
II. වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදලට ද දයක විය යුතු ය.
III. පත්වීම වසර 03 ක පරිවාස කාලයකට යටත් වන්නේ ය.
IV. මෙම බඳවා ගැනීම් ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසි වලටද රජය හෝ බස්නාහිර පළාත් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝග වලටද අනුකූල ය. ඒ අනුව ක්‍රියා කිරීමට සියළුම සේවකයින් බැඳී සිටිය යුතු වේ.

05. *බඳවා ගැනීමේ ක්‍රමය :*

I. විධිමත් සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සෙක් තෝරා ගැනේ.
(අවශ්‍යතාවය අනුව ලිඛිත / ව්‍යුහගත)

II. අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතික වල පිටපත් අමුනා එවිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.
- උප්පැන්න සහතිකය
- ජාතික හැඳුනුම්පත
- අධ්‍යාපන සහතික, ඉහළම අධ්‍යාපන සුදුසුකම් දක්වෙන වෙනත් සහතික
- තම පදිංචිය සහතික කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහතිකය
- මෑතකදී ලබා ගන්නා ලද චරිත සහතික 02ක්
(එක් චරිත සහතිකයක් ප්‍රදේශයේ ග්‍රාම නිළධාරි මහතාගෙන් ලබා ගත යුතුය. එය ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කළ යුතුය)
- වෘත්තීය පලපුරුද්ද හා වෙනත් සුදුසුකම් දක්වෙන සහතික
- දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිතව එවිය යුතුය.

III. අංක 01 සඳහා ලිඛිත පරීක්ෂණයක් පවත්වනු ලැබේ.
අංක 02 හා 03 සඳහා ප්‍රායෝගික පරීක්ෂණයක් පවත්වනු ලැබේ.

06. බඳවා ගැනීමේ පරිපාටිය අනුව ලබා ගන්නා ඉහලම ලකුණු අනුව සුදුස්සෙකු තෝරා ගනු ලැබේ.

07. මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්පත් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලැබේ.

08. *අයදුම්පත් :*
අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2017 මාර්තු 27 වැනි දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ "ලේකම්, දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව, දොඩන්ගොඩ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහල කෙලවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. තැපෑලේදී නැති වන සේ වැරදි ලෙස ලිපිනය ලිවීමෙන් ආපසු හරවා යැවූ අයදුම්පත් සම්බන්ධයෙන් වගකියනු නොලැබෙන අතර, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුරේදී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

මානෙල් සියඹලාගොඩ,
ලේකම් හා සභාවේ බලතල
කාර්යය හා කර්තව්‍ය ක්‍රියාත්මක
කරන නිළධාරි,
දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව.

2017 පෙබරවාරි මස 22 වැනි දින,
දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව,
දොඩන්ගොඩ.

**ආදර්ශ අයදුම් පත්‍රය**

***බස්නාහිර පළාතේ රාජ්‍ය සේවයේ දෙඩන්ගොඩ ප්‍රාදේශීය සභාවේ ..........................................................................***
***තනතුර සඳහා අයදුම් පත්‍රය***

01. මුලකුරු සමග නම :——————————————.
02. මුලකුරුවලින් හැඳින්වෙන නම :——————————————.
03. ස්ථිර ලිපිනය :——————————————.
04. ස්ථිර පදිංචි දිසත්‍රික්කය :——————————————.
05. ජාතික හැඳුනුම්පත් අංකය :——————————————.
06. දුරකතන අංකය :——————————————.
07. උපන් දිනය :- වර්ෂය :————. මාසය :————. දිනය :————.
08. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :——————————————.
අවුරුදු :————. මාස :————. දින :————.
09. විවාහක/අවිවාහක බව :——————————————.
10. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන්ද යන වග :-
11. අධ්‍යාපන සුදුසුකම් (පිටපත් අමුණා එවිය යුතුය) :——————————————.
12. වෙනත් සුදුසුකම් :——————————————.
13. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම්,
    I. දැනට දරන තනතුර :——————————————.
    II. එම තනතුරට පත් වූ දිනය:——————————————.
    III. ඔබ කවරදක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවකු කරනු ලැබ තිබේද?:——————.

මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට පෙර නුසුදුස්සෙකු වන බව හා පත්වීම ලැබීමෙන් පසුව ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් රහිතව සේවයෙන් පහ කිරීමට යටත් වන බවද දන්වමි.

——————.
දිනය :——————. අයදුම්කරුගේ අත්සන.

03-858

---

# පළාත් පාලන නිවේදන

## වරකාපොල ප්‍රාදේශීය සභාව

### ගෝ ඝාතක ව්‍යාපාරික ස්ථානයක් සම්බන්ධයෙන් වූ විරෝධතා කැඳවීමේ දැන්වීම්

වරකාපොළ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ අංක 70, මංගෙදර, තුල්හිරිය පදිංචි ඒ. එෆ්. එම්. රිෆායි නැමැති අය විසින් අංක 70, මංගෙදර, තුල්හිරිය (එම) ස්ථානයේ සෝ ඝාතක ව්‍යාපාරික ස්ථානයක් ආරම්භ කර පවත්වාගෙන යාම සඳහා ඉල්ලුම් කර ඇති බැවින්, එකී ස්ථානයේ සෝ ඝාතක ව්‍යාපාරික ස්ථානයක් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් දක්වන අයෙකු වේනම් මෙම නිවේදනය ප්‍රකාශයට පත්වූ දින සිට දින 30 ක් ඇතුළත එකී විරෝධතාවයට හේතු වන කරුණු ඇතුළත් ලිඛිත ප්‍රකාශයක් පිටපත් 02 කින් යුතුව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9:3 වගන්තිය ප්‍රකාරව වරකාපොල ප්‍රාදේශීය සභාවේ කාර්ය කර්තව්‍ය ඉටු කිරීමට බලය පැවරී ඇති නිලධාරී ලෙස කටයුතු කරන ලේකම් වෙත ලැබීමට සලස්වන මෙන් කාරුණිකව දන්වමි.

ලේකම්,
වරකාපොළ ප්‍රාදේශීය සභාව.

03 - 462

## සොරණාතොට ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

2015.12.04 වැනි දින *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ සඳහන් පරිදි 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (1) වගන්තිය ප්‍රකාර ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රිකයේ, සොරණාතොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති මංමාවත් සොරණාතොට ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කිරීමට ඉහත පනතේ 24 (2) උප වගන්තිය ප්‍රකාරව කිසිදු විරෝධතාවයක් ප්‍රකාශ නොවූ බැවින් එම මංමාවත් සොරණාතොට ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

### උපලේඛනය

| *පාර අංක* | *මාර්ගයේ නම* | *ග්‍රාම නිලධාරි වසම* | *මාර්ගයේ ආරම්භය* | *මාර්ගයේ අවසානය* | *මාර්ගයේ දිග(කි.මී)* | *මාර්ගයේ පළල(අඩි)* |
|---|---|---|---|---|---|---|
| 125 | අස්වැද්දුම මාර්ගය | බෝලියද්ද | බෝලියද්ද පංසල | අස්වැද්දුම | 0.527 | 10 |
| 126 | කම්මල්වත්ත මාර්ගය | බෝලියද්ද | බුද්ධජයන්ති මාවත | ඉළුක්ගොල්ල | 0.556 | 08 |
| 127 | 06 කණුව රබර්වත්ත මාර්ගය | පුස්සැල්ලාව | වත්තේකැලේ එගොඩවෙල මාර්ගය | බදුල්ල මහියංගණ ප්‍රධාන මාර්ගය | 0.830 | 10 |

ඉහත සඳහන් උපලේඛනයේ අස්වැද්දුම මාර්ගය අයත් ග්‍රාම නිළධාරී වසම බෝලියද්ද වෙනුවට පුස්සැල්ලාව ලෙස සංශෝධනය විය යුතුය.

එල්. ජී. ආර්. ශාන්තිලතා,
සභා ලේකම්,
සොරණාතොට ප්‍රාදේශීය සභාව.

2017ක් වූ පෙබරවාරි මස 13 වැනි දින,
සොරණාතොට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

03-803

---

## ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභව

අතුරු ව්‍යවස්ථාව

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ ලේකම් එස්. ඒ. චින්තක කුමාර වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය කියවීමේදී එම පනතින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරී වශයෙන් 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථාව) පනතේ ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල පළමු හා දෙවන කොටසේ අංක 1 සිට 42 දක්වා වූ අතුරු ව්‍යවස්ථාවල අංක 21 වැනි අතුරු ව්‍යවස්ථාවට අනුව ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ අන්තරායදායක, අප්‍රසන්න, අප්‍රසන්න හා අන්තරාදායක යන වෙළදාම් වෙන් වෙන්ව හඳුනාගෙන පිළිගැනීම හා එම අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් තීරණ වර්ෂ 2015.10.14 වැනි දින තීරණ අංක 251 යටතේ ගන්නට යෙදුණු බව මෙයින් නිවේදනය කරමි.

එස්. ඒ. චින්තක කුමාර,
ලේකම්,
ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව.

2017 පෙබරවාරි මස 16 වැනි දින,
තුංකම ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**ඉහත කී තීරණය**

1999.10.08 වැනි දින අංක 1101 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මගින් ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන වැලඳගත් බව මහජනතාව වෙත නිවේදනය කර ඇති 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ දෙවන වගන්තිය යටතේ පළාත් පාලන නිවාස හා ඉදි කිරීම් අමාත්‍යංශය විසින් සම්පාදනය කරනු ලැබූ 1988.08.23 වැනි දින අංක 520(7) දරන රජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* (IV වන කොටස) මගින් පළ කර සබරගමුව පළාත් සභාවේ යෝජනාවකින් පිළිගන්නට යෙදුනු අනුමත කළ නිවේදනයට අදළ පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල (සම්මත අතුරු ව්‍යවස්ථා) 01 සිට 42 දක්වා වූ අතුරු ව්‍යවස්ථාවල අංක 21 වැනි අතුරු ව්‍යවස්ථාවට අනුව ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පහත අංක 01 සිට 03 දක්වා උපලේඛනවල සඳහන් අන්තරායදයක වෙළඳාම්, අප්‍රසන්න වෙළඳාම් හා අප්‍රසන්න අන්තරායදායක වෙළඳාම් වෙන් වෙන්ව හඳුනාගෙන පිළිගැනීමටත්, එම අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීමටත්, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්යය කර්තව්‍ය ඉටු කරන ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ ලේකම් එස්. ඒ. චින්තක කුමාර වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවීමේදී එම පනතින් මා වෙත පැවරී ඇති බලතල අනුව තීරණය කරමි.

*උපලේඛනය අංක 01*

*අන්තරායදායක ව්‍යාපාර :*

01 ලැගුම්හල්
02 හෝටල්
03 බත්කඩ/ආපන ශාලා සහ තේ/කෝපි කඩ
04 බේකරි
05 කිරි පට්ටි හා කිරි වෙළඳාම
06 මාළු වෙළඳාම
07 මස් වෙළඳාම
08 අයිස් කර්මාන්ත ශාලා
09 සිසිල් බීම කර්මාන්ත ශාලා
10 ලොන්ඩරි
11 ගව ගාල්
12 ඝාතන මඩු
13 කොණ්ඩා සැකසීම (සැළුන්හල් සහ බාබර් සාප්පු)
14 ග්‍රොසරි
15 ගල් වල
16 වී මෝල්
17 ගල් ඇඹරීම (මෝල)
18 හුණු නිපදවීම හා අලෙවිය
19 සබන් නිපදවීම
20 වෑල්ඩින් වැඩපලවල්

*උපලේඛනය අංක 02*

*අප්‍රසන්න ව්‍යාපාර :*

01 භෝජන ශාලාවක් පවත්වාගෙන යාම
02 නේවාසික පහසුකම් සහිත හෝටලයක් පවත්වාගෙන යාම
03 බැටරි චාජ් කරන ස්ථාන
04 රස කැවිලි හා බයිට් වර්ග නිෂ්පාදනය හා අලෙවිය
05 සිරප් හෝ පළතුරු බීම සකස් කරන ස්ථාන
06 කුළුබඩු හා විවිධ ආහාර පැකට් කර විකිණීම
07 ශීත කළ මස් මාළු අලෙවිය
08 බිත්තර වෙළඳාම
09 කිරි ආශ්‍රිත ආහාර නිෂ්පාදනය හා අලෙවිය
10 රූපලාවන්‍යාගාරයක් පවත්වාගෙන යාම
11 සත්ව ගොවිපළක් පවත්වාගෙන යාම
12 දන්ත ශාල්‍යාගාරයක් පවත්වාගෙන යාම
13 ක්ෂණික ආහාර වර්ග නිෂ්පාදනය හා අලෙවිය
14 මල් ශාලාවක් පවත්වාගෙන යාම

**ඉහත කී උපලේඛනය අංක 03**

*අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර :*

01 ඇඹරුම් හලක් පවත්වාගෙන යාම
02 ගඩොල් නිපදවීම
03 හිස් බෝතල්, පරණ යකඩ මිලට ගැනීම
04 විසිරි පින්තාරු කිරීම
05 පොහොර වර්ග හා කෘෂි රසායනික ද්‍රව්‍ය අලෙවිය
06 කොහු මෝල්
07 පරණ භාණ්ඩ මිලට ගැනීම හා අලෙවිය

03-859

---

**සංශෝධනයයි**

ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව

2016.08.26 වැනි දින පළ වූ අංක 1982 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටස - පළාත් පාලන නිවේදන යටතේ, නිවේදන අංක 08 - 774 හි ලේකම්තුමාගේ නම

ඒ. එෆ්. පී. ප්‍රනාන්දු,
ලේකම්,
ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව ලෙස සංශෝධනය විය යුතුය.

ඒ. එෆ්. පී. ප්‍රනාන්දු,
ලේකම්,
ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව.

2017 පෙබරවාරි මස 23 වැනි දින,
ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

03-460

---

## වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 139 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත සඳහන් නියමය කිරීමට තීරණය කර ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. එම්. අයි. බී. හේරත්,
ලේකම්,
වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව.

2016 දෙසැම්බර් මස 29 වැනි දින,

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 139 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර වනාතවිල්ලුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත වරිපනම් කාර්ය සඳහා යම් ගෙයක, ගොඩනැගිල්ලක, ඉඩමක හෝ ගෙපතක වාර්ෂික වටිනාකම තක්සේරු කිරීමේ කාර්යය සඳහා සහ අක්කර බද්දේ කාර්යය සඳහා යම් වගා කළ ඉඩමක විශාලත්වය තක්සේරු කිරීම සඳහා එකී යම් දේපළක අයිතිකරුට සහ පදිංචිකරුට එහි කුළිය හෝ වාර්ෂික වටිනාකම හෝ එහි විශාලත්වය පිළිබඳ වාර වාර්තා සපයන ලෙස නියම කළ යුතු යැයි, එකී පනතේ 9 වන වගන්තියේ (3) වන උපවගන්තියෙන් තීරණ අංක 1038 යටතේ එකී ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා වශයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මම මෙයින් තීරණය කරමි.

**දේපළවල වාර්ෂික වටිනාකම තක්සේරු කිරීමට/ අක්කර බදු කාර්යය සඳහා දේපළ සතොක්ෂණය කිරීමට අවශ්‍ය වාර වාර්තාව**

වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව
(ආකෘතිය සම්පූර්ණ කිරීමට පෙර අවසානයේ ඇති උපදෙස් හොඳින් පිළිපදින්න)

01. දේපළෙහි අයිතිකරු/ වන්ගේ සම්පූර්ණ නම/ නම් : (හවුල් අයිතියක් ඇති විට සෑම අයිතිකරුවකුගේ ම නම්)
(අ) ..............................................................................................................
(ආ) ..............................................................................................................
(ඇ) ..............................................................................................................
(ඈ) ..............................................................................................................
(ඉ) ..............................................................................................................

02. දේපළෙහි අයිතිකරු/ වන්ගේ ලිපිනය/ ලිපින : (හවුල් අයිතියක් ඇති විට ඉහත අංක 01 හි අනුපිළිවෙල අනුව)
(අ) ..............................................................................................................
(ආ) ..............................................................................................................
(ඇ) ..............................................................................................................
(ඈ) ..............................................................................................................
(ඉ) ..............................................................................................................

03. අයිතිකරු/ වන්ගේ ජාතික හැඳුනුම්පත් අංකය/ අංක : (හවුල් අයිතියක් ඇති විට ඉහත අංක 01 හි අනුපිළිවෙලට)
(අ) ..............................................................................................................
(ආ) ..............................................................................................................
(ඇ) ..............................................................................................................
(ඈ) ..............................................................................................................
(ඉ) ..............................................................................................................

04. ඉදිරි කටයුතුවල දී ප්‍රාදේශීය සභාව සමග ගණුදෙනු කිරීමේ පහසුව සඳහා විද්‍යුත් තැපැල් ලිපිනයක් තිබේ නම්, අයිතිකරු/ අයිතිකරුවන්ගේ විද්‍යුත් තැපැල් ලිපිනය/ ලිපින : (හවුල් අයිතියක් ඇති විට ඉහත අංක 01 හි අනුපිළිවෙල අනුව)
(අ) ..............................................................................................................
(ආ) ..............................................................................................................
(ඇ) ..............................................................................................................
(ඈ) ..............................................................................................................
(ඉ) ..............................................................................................................

05. අයිතිකරු හෝ අයිතිකරුවන් වෙනුවෙන් මේ ආකෘතිය සම්පූර්ණ කරනු ලබන්නේ ඇටෝර්නි බලය පැවරී ඇති යම් තැනැත්තකු හෝ තැනැත්තන් වන විට, ඇටෝර්නි බලකරු/කරුවන් පිළිබඳ විස්තර.

| | අයිතිකරුගේ නම | ඇටෝර්නි බලකරුගේ නම | ජා.හැ.ප. අංකය |
|---|---|---|---|
| (අ) | .................................... | .................................... | .................................... |
| (ආ) | .................................... | .................................... | .................................... |
| (ඇ) | .................................... | .................................... | .................................... |
| (ඈ) | .................................... | .................................... | .................................... |
| (ඉ) | .................................... | .................................... | .................................... |

06. දේපළෙහි පිහිටීම :
(අ) ග්‍රාම නිලධාරි කොට්ඨාස අංකය හා නම : අංකය .................. නම ....................................
(ආ) ප්‍රාදේශීය සභා කොට්ඨාස අංකය සහ නම (දන්නේ නම්) :
අංකය :.................. නම :................................
(ඇ) පාර හෝ වීථිය :....................................

07. වරිපනම් හෝ අක්කර බදු අංකය (දැනටමත් අංකයක් දී ඇත්නම්) :..................

08. ඉඩමේ ප්‍රමාණය : අක්කර : ..................රූඩ් :..................පර්චස් :............... (හෙක්ටයාර්..................)

09. ඉඩමට මායිම් : ඉඩමේ ඔප්පුවේ සහ මිනින්දෝරු සැලැස්මේ දැක්වෙන මායිම් අනුව සටහන් කළ යුතු අතර, ඒ තොරතුරු සමග මේ විස්තර නිවැරදි විය යුතු ය.

*උතුරට :* ..............................................................................................................
..............................................................................................................
..............................................................................................................

*නැගෙනහිරට :* ..............................................................................................................
..............................................................................................................
..............................................................................................................

*දකුණට :* ..............................................................................................................
..............................................................................................................
..............................................................................................................

*බස්නාහිරට :* ..............................................................................................................
..............................................................................................................
..............................................................................................................

10. අයිතිකරුට/ අයිතිකරුවන්ට ඉඩම අයත් වූ ආකාරය :...............................................
(අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් විසින් දේපළට අදාළව (වසර 30 ක පූර්ව කාලයක් සඳහා) නිකුත් කළ පත් ඉරුවල මුල් පිටපත සහ සහතික කරන ලද පිටපත් අමුණන්න)

11. *(අ)* ඔප්පුවේ අංකය :........................
*(ආ)* නොතාරිස්තැනගේ නම :...............................................
*(ඇ)* ලියාපදිංචි කළ දිනය :........................
(ඔප්පුවේ සහතික කරන ලද පිටපත් දෙකක් අමුණන්න)

12. ඉඩමේ මිනින්දෝරු සැලැස්ම පිළිබඳ විස්තර :
*(අ)* අංකය :........................
*(ආ)* සැලසුමේ දිනය :........................
*(ඇ)* මිනින්දෝරුතැනගේ නම :........................
(මිනින්දෝරු සැලැස්මේ සහතික කරන ලද පිටපත් දෙකක් අමුණන්න - ප්‍රාදේශීය සභාවෙන් අනුමැතියක් ලබා ඇති අනුබෙදුම් සැලැස්මක් තිබෙන විට එහි සහතික පිටපත් අවශ්‍ය වේ.-)
*(ඇ)* සැලැස්මේ පරිමාණය :........................

13. ඉඩම තුළ ගොඩනැගිලි ඇත්නම් - (ප්‍රාදේශීය සභාවෙන් අනුමැතිය ලබා ඇති ගොඩනැගිලි සැලසුම් තිබේ නම්, ඒවායේ (පිටපතෙහි ප්‍රමාණයටම ලබාගත්) සහතික කළ පිටපත් දෙකක් අමුණන්න)
(අ) පවතින ගොඩනැගිලි සංඛ්‍යාව : ............සහ (ආ) එක් එක් ගොඩනැගිලි විස්තර :

| *ගොඩනැගිලි අංකය* 1 | *ස්වභාවය* 2 | *භාවිතා කරන කාර්යය* 3 |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

(ප්‍රධාන ගොඩනැගිල්ලට අංක 01 වශයෙන් යොදමින් ඉතිරි ගොඩනැගිලි එකින් එක අංක කර, 1 වැනි තීරුවේ ද, එක් එක් ගොඩනැගිල්ල තනි මහලකින් ද, දෙමහල් ද, තෙමහල් ද ආදී වශයෙන් 2 වැනි තීරුවේ ද, එක් එක් ගොඩනැගිල්ල භාවිත කරනු ලබන ආකාරය නේවාසික/ වාණිජ/ කර්මාන්ත ශාලා ද යනුවෙන් 3 වන තීරුවේ ද සටහන් කරන්න.)

14. ඉඩමේ හෝ ගොඩනැගිල්ල තුළ යන්ත්‍ර සූත්‍ර සවිකර ඇත්නම්, ඒ පිළිබඳ විස්තර :

| *යන්ත්‍ර සූත්‍ර වර්ගය* 1 | *මිලදී ගත් දිනය* 2 | *වටිනාකම* 3 |
|---|---|---|
| *අ.* | | |
| *ආ.* | | |
| *ඇ.* | | |
| *ඈ.* | | |
| *ඉ.* | | |
| | | |

(1 වැනි තීරුවේ යන්ත්‍රය කුමක් ද යන්න ද, ඒ යන්ත්‍රය මිල දී ගත් දිනය 2 වැනි තීරුවේ ද, එක් එක් යන්ත්‍රය මිල දී ගත් දිනයේ වටිනාකම කොපමණ ද යන්න 3 වැනි තීරුවේ ද යන්න සටහන් කරන්න. ඒ සමගම ඒ එක් එක් යන්ත්‍ර සූත්‍ර පිළිබඳ විස්තරය, මිල දී ගත් දිනය සහ වටිනාකම දැක්වෙන ප්‍රකාශයක පිටපත් දෙකක් සහ මිල දී ගත් කුවිතාන්සිවල පිටපත් දෙක බැගින් මේ ආකෘතියට අමුණන්න)

15. ඉඩම තුළ වගාවක් පවතී නම් ඒ පිළිබඳ විස්තර.
..............................................................................................................
..............................................................................................................
..............................................................................................................
..............................................................................................................
..............................................................................................................
..............................................................................................................

16. දේපළ කුළියට හෝ බද්දට දී තිබේ නම්, කුළී නිවැසියා හෝ බදුකරුගේ :
*(අ)* නම :..............................................................................
*(ආ)* ජාතික හැඳුනුම්පත්‍ර අංකය :..............................................................................
*(ඇ)* තව දුරටත් ඉතිරි වී ඇති ගිවිසුම් ගත කාලය : අවුරුදු:......... මාස:.........දින:.........

17. ඉහත සඳහන් කර ඇති තොරතුරු මාගේ/ අපගේ දැනීමේ හා විශ්වාසයේ ආකාරයට නිවැරදි බවත්, මෙහි කිසිදු අසත්‍ය හෝ සාවද්‍ය තොරතුරු කිසිවක් ඇතුළත් කර නොමැති බවටත් සහතික කරමි/කරමු. මේ ලේඛනයේ ඇතුළත් කර ඇති තොරතුරු සහ අමුණා ඇති ලේඛන කිසිවක් අසත්‍ය හෝ සාවද්‍ය බව තහවුරු වුවහොත්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 139 වැනි වගන්තියේ (3) වැනි උප වගන්තියේ සඳහන් ආකාරයට වරදකට වරදකරු/ වරදකරුවන් වන බවත්, වරදකරු/ වරදකරුවන් කරනු ලැබුවහොත් අධිකරණය විසින් නියම කරනු ලබන දඬයකට මම/අපි යටත් වන බවත් දනිමි./දනිමු.

දේපළෙහි අයිතිකරු/ අයිතිකරුවන් නැතහොත් ඇටෝර්නි බලකරු/ බලකරුවන් වන මම; *

| නම/නම් | | අත්සන/අත්සන් |
|---|---|---|
| *(අ)* | ........................................................ | ................................................ |
| *(ආ)* | ........................................................ | ................................................ |
| *(ඇ)* | ........................................................ | ................................................ |
| *(ඈ)* | ........................................................ | ................................................ |
| *(ඉ)* | ........................................................ | ................................................ |

දිනය : 20.....................

* අදාළ නොවන වචන කපා හරින්න.

කරුණාකර, දේපළට පිවිසිය හැකි මාර්ගය පැහැදිළිව මෙහි පහත කොටුවේ සටහන් කරන්න.

**විශේෂයෙන් දැනගත යුතු කරුණු සහ ආකෘතිය සම්පූර්ණ කිරීමට උපදෙස්**

*(අ)* ඔබ විසින් සපයනු ලබන මේ තොරතුරුවල රහස්‍යභාවය නිරන්තරයෙන් රැකීමට ප්‍රාදේශීය සභාව බැඳී සිටින බව පළමුවෙන් ම ඔබට දැන්විය යුතු ව ඇත. අධිකරණ නියෝගයකින් විනා කිසිදු අවස්ථාවක, මේ තොරතුරු කිසිවක් ඉඩමේ, ඒ අවස්ථාවේ නීත්‍යානුකූල අයිතිකරුවෙකු වශයෙන් සභාවේ ලේඛනවල සටහන් ව නොමැති වෙනත් යම් තැනැත්තකුට නිකුත් නොකරන බව සහතික කරමි.

*(ආ)* මේ දේපළට අදාළ ව, ඉදිරියේ දී වරිපනම් අංකයක් හෝ අක්කර බදු අංකයක් නිකුත් කිරීම නැතහොත් මේ වන විටත් එවැනි අංකයක් නිකුත්කර තිබීම සහ වරිපනම් කාර්යය හෝ අක්කර බදු කාර්යය ක්‍රියාත්මක කිරීමේ හේතුව නිසා ම, මේ ආකෘතියෙහි සඳහන් යම් මිනින්දෝරු සැලැස්මකට අනුමැතියක් දී ඇති ලෙස හෝ ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ලබා ගත යුතු වන ඉදිකිරීම් බලපත්‍රයක් නිකුත්කර ඇති ලෙස හෝ එවැනි යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් අනුකූලතා සහතිකයක් නිකුත් කර ඇති ලෙස හෝ සැලකීමට ඒ දේපළෙහි අයිතිකරුට නැතහොත් අයිතිකරුවන්ට කිසිදු නීතිමය අයිතියක් නැති සේ සැලකිය යුතු ය.

*(ඇ)* නිවාස හා නගර සංවර්ධන ආඥාපනතේ හෝ නාගරික සංවර්ධන අධිකාරිය පනත යටතේ සාදන ලද "සැලසුම් හා ගොඩනැගිලි නියෝග" යටතේ යම් අනුමැතියක් හෝ බලපත්‍රයක් ලබා ගැනීමට ඉඩමේ අයිතිකරු නැතහොත් අයිතිකරුවන් යටත් වන යම් අවස්ථාවක, ඒ අනුමැතිය හෝ බලපත්‍රය ලබා ගැනීමට ඔහු නැතහොත් ඔවුන් යටත් විය යුතු ය.

(ඉ) මේ ආකෘතිය නිකුත් කරනු ලබන්නේ අදාළ දේපළෙහි ඒ අවස්ථාවේ දී පදිංචිව සිටින තැනැත්තාට හෝ ඒ දේපළෙහි ඒ අවස්ථාවේ සිටින තැනැත්තාට වේ.

(ඊ) මේ අකෘතිය සමග ලැබෙන නිවේදනය ලබා ගන්නා තැනැත්තා අදාළ දේපළෙහි අයිතිකරු නොවේ නම්, වහාම අදාළ නිවේදනය සහ මේ ආකෘතිය දේපළෙහි අයිකරුට ලැබීමට සැලැස්වීම, ඔහුගේ වගකීම විය යුතු ය.

(උ) මේ ආකෘතිය අදාළ දේපළෙහි අයිතිකරු විසින් හෝ හවුල් අයිතිකරුවන් සිටී නම්, ඔවුන් සියළුම දෙනා විසින් ම අත්සන් කර ඉදිරිපත් කළ යුතු ය.

(ඌ) යම් හෙයකින් මේ ආකෘතිය සම්පූණ කිරීමට අයිතිකරුවකුට/අයිතිකරුවන්ට නොහැකි වන්නේ නම්, ඒ අයිතිකරු හෝ අයිතිකරු විසින් ඇටෝර්නි බලය පවරන ලද යම් තැනැත්තෙකු හෝ තැනැත්තන් විසින් මේ ආකෘතිය සම්පූර්ණ කර ඉදිරිපත් කළ හැකි ය. එසේ වුව ද, ඒ ඇටෝර්නි බලකරු විසින් මේ ආකෘතිය සමග පහත සඳහන් ලියවිලි ද ඉදිරිපත් කළ යුතු ය.

(i) ලියාපදිංචි කරන ලද ඇටෝර්නි බලපත්‍රයේ සහතික කරන ලද පිටපත් දෙකක්,

(ii) ඇටොර්නි බලකරුට මේ කාර්යය කිරීම හෙවත් අදාළ දේපළ සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට ඇටෝර්නි බලපත්‍රයෙන් බලය පවරා දී තිබෙන බවටත්, බලය පවරන ලද තැනැත්තා මේ වන තෙක් ම ජීවතුන් අතර සිටින බවට සහ අදාළ ඇටෝර්නි බලපත්‍රය මේ වන තෙක් ම අවලංගු කර නොමැති බවටත් ප්‍රකාශ කෙරෙන දිවුරුම් ප්‍රකාශයක් සහ ඒ දිවුරුම් ප්‍රකාශයේ සහතික කරන ලද පිටපතක්.

(එ) කරුණාකර, ආකෘතියෙහි එක් එක් අංකය සඳහා තොරතුරු ලබාදීමට පහත උපදෙස් අනුගමනය කරන්නः-

(01) දේපළෙහි අයිතිකරු හෝ අයිතිකරුවන්ගේ සම්පූර්ණ නම නැතහොත් නම් මෙහි ඇතුළත් කරන්න,

(02) ඉහත අංක 01 හි දක්වා ඇති අනුපිළිවෙලින් එක් එක් අයිතිකරුගේ ලිපිනයන් සඳහන් කරන්න,

(03) ඉහත අංක 01 හි දක්වා ඇති අනුපිළිවෙලින් එක් එක් අයිතිකරුගේ ජාතික හැඳුනුම්පත්‍රවල අංකයන් මෙහි සඳහන් කරන්න,

(04) ප්‍රාදේශීය සභාව සමග ඉදිරි කටයුතු විද්‍යුත් තැපැල මගින් සිදුකිරීමට අවස්ථාව ලබාදීමට අපේක්ෂා කරන බැවින්, ඔබගේ සහ ප්‍රාදේශීය සභාවේ පහසුව සඳහා අයිතිකරුට හෝ අයිතිකරුවන්ට විද්‍යුත් තැපැල් ලිපිනයන් තිබේ නම්, ඉහත අංක 01 හි දක්වා ඇති අනුපිළිවෙලින් එක් එක් අයිතිකරුගේ විද්‍යුත් තැපැල් ලිපිනයන් මෙහි සඳහන් කරන්න,

(05) කිසියම් හේතුවක් නිසා දේපළෙහි අයිතිකරුට නැතහොත් අයිතිකරුවන්ට මේ ආකෘතිය සම්පූර්ණ කර භාර දීමට නොහැකි වන අවස්ථාවක, ඒ අයිතිකරු නැතහොත් අයිතිකරුවන් විසින් යම් තැනැත්තකුට හෝ තැනැත්තන්ට මේ කාර්යය සඳහා නැතහොත් අදාළ ඉඩමේ පරිපාලන සහ වාර්තා සැපයීම සඳහා ඇටෝර්නි බලපත්‍රයක් මගින් බලය පවරා දී ඇත්නම්, එසේ ඇටෝර්නි බලය පැවරී ඇති තැනැත්තා හෝ තැනැත්තන් විසින් ඒ දේපළෙහි අයිතිකරු හෝ අයිතිකරුවන් වෙනුවෙන් මේ ආකෘතිය සම්පූර්ණ කර භාර දීමට හැකියාව ඇත. එවැනි යම් අවස්ථාවක, ඉහත උපදෙස්වල (ඌ) ඡේදය අනුව ක්‍රියා කළ යුතු ය,

(06) ඔබගේ දේපළ පිහිටා ඇති ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ අංකය හා නම ද, ප්‍රාදේශීය සභාවට අදාළ ඡන්ද කොට්ඨාසය (දන්නේ නම්) ද සහ ඉඩම මුහුණ ලා තිබෙන ප්‍රධාන පාරේ හෝ වීථියේ නාමය (නාමයක් ඇත්නම්) මෙහි සඳහන් කරන්න. කෙසේ වුව ද, මේ ආකෘතියේ 6 වැනි පිටුවේ ඉල්ලා ඇති ආකාරයට දේපළට ප්‍රවේශ වීමට පහසු මාර්ගය රූප සටහනකින් පෙන්වන්න,

(07) ඔබගේ දේපළට වරිපනම් කාර්යය සඳහා වරිපනම් අංකයක් හෝ අක්කර බදු කාර්යය සඳහා ප්‍රාදේශීය සභාවෙන් අක්කර බදු අංකයක් ලබා දී ඇත්නම්, ඒ අංකය නිවැරදි ව මෙහි සටහන් කරන්න,

(08) ඉඩමේ ප්‍රමාණය අක්කර, රූඩ් සහ පර්චස් පරිමාණයෙන් සහ හෙක්ටයාර් පරිමාණයෙන් මෙහි සටහන් කරන්න. කෙසේ වුව ද, මෙහි සඳහන් කරන භූමි ප්‍රමාණය ඉඩමේ ඔප්පුවේ දැක්වෙන ප්‍රමාණය සහ ඉඩමේ මිනින්දෝරු සැලැස්මේ දැක්වෙන භූමි ප්‍රමාණය ද සමග නිවැරදි විය යුතු ය. යම් වෙනසක් වේ නම් ඊට හේතු දැක්වෙන සටහනක් වෙනම මේ ආකෘතියට අමුණන්න,

(09) අදාළ ඉඩමේ මායිම් මෙහි නිවැරදිව සටහන් කරන්න.

(10) අයිතිකරුට නැතහොත් අයිතිකරුවන්ට අදාළ දේපළ අයිති වූ ආකාරය මෙහි සඳහන් කරන්න. ඒ සමගම, ඉඩමේ හිමිකම තහවුරු කෙරෙන අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් විසින් නිකුත් කරනු ලබන ඉඩම් ලියාපදිංචි කිරීම පිළිබඳව පසුගිය වසර 30 ක කාලයක් සඳහා වන පත් ඉරුවල මුල් පිටපත සහ එහි සහතික කරන ලද ඡායා පිටපතක් අමුණන්න,

(11) ඔප්පුව පිළිබඳ ඉල්ලා ඇති තොරතුරු මෙහි ඇතුළත් කර, ඔප්පුවේ සහතික කරන ලද ඡායා පිටපත් දෙකක් අමුණන්න,

(12) ඉඩම සඳහා අඳින ලද මිනින්දෝරු සැලැස්මේ විස්තර මෙහි සටහන් කර, සැලැස්මේ ප්‍රමාණයට ම ලබාගත් ඡායා පිටපත් දෙකක් සහතික කර අමුණන්න. ඉඩමේ සැලැස්ම සඳහා ප්‍රාදේශීය සභාවෙන් අනුමැතියක් ලබාගෙන ඇති විටෙක, මෙයට ඇමිණිය යුත්තේ එහි පිටපත් බව සළකන්න,

(13) ඉඩමේ ගොඩනැගිලි කිසිවක් වේ නම් (තාවකාලික ගොඩනැගිලි ද ඇතුළත් ව), ඒ පිළිබඳ විස්තර පිළිවෙලින් මෙහි සඳහන් කරන්න. ගොඩනැගිලි කිහිපයක් ඇති විට, ප්‍රධාන ගොඩනැගිල්ල වශයෙන් සැළකෙන ගොඩනැගිල්ලට මෙහි 1 වැනි තීරුවේ ගොඩනැගිලි අංකය ලෙස අංක 01 වශයෙන් සළකා ඉතිරි ගොඩනැගිලිවලට පිළිවෙලින් අංක දෙමින් මෙහි තොරතුරු ඇතුළත් කරන්න. මෙහි ස්වභාවය යනුවෙන් අදහස් කරනුයේ ගොඩනැගිල්ල තනි මහලක එකක් ද නැතහොත් මහල් කිහිපයක එකක් නම් මහල් කීයක් ද යන්න වේ. එසේ ම එක් එක් ගොඩනැගිල්ල භාවිතා කරනුයේ කුමන කාර්යයකට ද යන්නත් නිවැරදිව සටහන් කරන්න,

(14) ඉඩම තුළ හෝ ගොඩනැගිලි තුළ යන්ත්‍ර සූත්‍ර කිසිවක් සවිකර ඇත්නම්, ඒ පිළිබඳ විස්තර මෙහි සඳහන් කරන්න,

(15) ඉඩම තුළ ස්ථිර හෝ නිතිපතා කෙරෙන වගාවකට යොමුකර ඇත්නම්, ඒ වගාව සහ වගාවට යට වී ඇති බිම් ප්‍රමාණයද පිළිබඳ තොරතුරු මෙහි ඇතුළත් කරන්න,

(16) දේපළ කිසියම් තැනැත්තෙකුට හෝ තැනැත්තන්ට කුලියට හෝ බද්දට දී ඇති විටෙක, මේ අංකය යටතේ ඉල්ලා ඇති තොරතුරු සපයන්න,

(17) මේ යටතේ වන සහතිකය සඳහා අත්සන් කරනු ලබන්නේ දේපළෙහි අයිතිකරු හෝ අයිතිකරුවන් ද නැතහොත් ඇටෝර්නි බලකරු හෝ ඇටෝර්නි බලකරුවන් ද යන්න පැහැදිලි වන පරිදි අදාළ නොවන වචන කපා ඉවත් කරන්න. මෙහි සඳහන් සහතිකය 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 139 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියේ නියමයන්ට අනුකූල ව සකස් කර ඇත. ඒ උපවගන්තියේ උධෘතයක් පහත දක්වා ඇතඃ-

"(3) *(අ)* මෙහි නිශ්චිත ව සඳහන් වාර වාර්තාව සපයන ලෙස නියම කරනු ලැබූ දින සිට දවස් හතක් ඇතුළත එම වාර වාර්තාව සැපයීම පැහැර හරින හෝ නොසළකා හරින; හෝ

*(ආ)* දැනුවත්ව ම අසත්‍ය හෝ සාවද්‍ය වාර වාර්තාවක් සපයන ; හෝ

*(ඇ)* ඉහත කී පරිදි බලය පවරන ලද යම් තැනැත්තකුට එවැනි යම් ගෙයකට, ගොඩනැගිල්ලකට, ඉඩමකට හෝ ගෙපතකට ඇතුල් වීමට හෝ පරීක්ෂා කිරීමට හෝ අවශ්‍ය වූයේ නම් මැනීමට අවහිර කරන, බාධා කරන හෝ වළක්වාලන ; හෝ

*(ඈ)* (2) වැනි උපවගන්තිය අනුව කටයුතු කිරීම පැහැර හරින සෑම තැනැත්තකු ම වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය."

03-708

---

**පූජාපිටිය ප්‍රාදේශීය සභාව**

2017 වර්ෂය සඳහා සෝ සාතක ආඥපනත යටතේ විරෝධතා කැඳවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 ඃ 3 වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සෝ සාතක ආඥ පනත යටතේ විරෝධතාවයන් කැඳවීමට 2017 වර්ෂයේ පෙබරවාරි මස 23 වැනි දින තීරණ අංක 588 යටතේ පහත ආකාරයට තීරණය කරන බව මෙයින් නිවේදනය කරමි.

2017 පෙබරවාරි මස 23 වැනි දින,
පූජාපිටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

චාමින්ද්‍රි අමදෝරු,
ලේකම්,
පූජාපිටිය ප්‍රාදේශීය සභාව,
පූජාපිටිය.

**තීරණය**

මෙහි පහත උපලේඛනයෙහි නම් සඳහන් අය විසින් ඔහුගේ නම ලිපිනය සඳහන් ස්ථානයේ එළු මස් වෙළෙඳසැලක් පවත්වාගෙන යාමට ගෝ ඝාතක ආඥා පනත යටතේ බලපත්‍රයක් නිකුත් කිරීමට විරුද්ධත්වයක් දක්වන්නන් වෙතොත් එසේ විරුද්ධත්වය දැක්වීමට හේතු සඳහන් කරමින් මේ නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දිනයේ සිට සති 02 ක් ගෙවීමට මත්තෙන් පිටපත් දෙකකින් යුක්තව ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනැවිත් පූජාපිටිය ප්‍රාදේශීය සභා කාර්යාලයට භාර දෙන ලෙස දන්වා විරෝධතා කැඳවීමට තීරණය කරමි.

| *නම* | *එළු මස් වෙළෙඳ සැල පවත්වාගෙන යාමට අපේක්ෂිත ස්ථානය* |
|---|---|
| 03. එම්. එස්. අබ්දුල් මවුජුඩ් | ග්‍රීන් ස්ටාර්ස්,<br>අංක 232, පල්ලියකොටුව, අඹතැන්න. |

03-857

---

**හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව**

1893 අංක 9 දරන ගෝඝාතක ආඥාපනත හා ඊට සංශෝධන පනත යටතේ එහි අංක 7(1) හි පරිදි එළ හරක් මස් විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා (ජා.හැ.අංක 732582916 V) මොහොමඩ් සිද්දික් මොහොමඩ් සාජහාන් මහතා විසින් මෙහි සඳහන් වගුවේ විස්තර වන ස්ථානයට බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කොට ඇත.

02. එකී ස්ථානයට එබඳු බලපත්‍රයක් නිකුත් කිරීමට විරුද්ධව කරුණු ඉදිරිපත් කරනු කැමති වූ හාරිස්පත්තුව ප්‍රාදේශීය සභා බල සීමාව ඇතුළත පදිංචි තැනැත්තන් විසින් එසේ විරුද්ධත්වයට තිබෙන කරුණු පිළිබඳ ලිඛිත ප්‍රකාශයක් පිටපත් දෙකකින් (2) යුක්තව මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කළ දින සිට දින 60ක් ඇතුළත පහත සඳහන් නිසි බලධාරියා වන එහි සඳහන් 3 ආ වගන්තිය හා 1987 අංක 15 දරන එම පනතේ 9 වැනි වගන්තිය හා 3 වැනි වගන්තියේ විධිවිධානයට අනුව නිසි බලධාරියා වූ ලේකම් හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව තිත්තපජ්ජල, වැරැල්ලගම වෙත එවිය යුතුය. තැපෑලෙන් එවන විට ලියුම් කවරයේ වම් පැත්තේ ඉහළ කෙලවරේ විරෝධකරු ලෙස සඳහන් කළ යුතු අතර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

**එළගවමස් වෙළෙඳ සැල පවත්වාගෙන යාමට ඉල්ලුම් කරන ස්ථානයේ විස්තර ඇතුලත් වගුව**

| *එළගවමස් වෙළඳ සැල පවත්වාගෙන යාමට ඉල්ලුම් කළ තැනැත්තාගේ නම හා ලිපිනය* | *ස්ථානය, අයිතිකරුගේ නම හා ලිපිනය* | *එළගවමස් වෙළඳ සැල පවත්වාගෙන යාමට අදහස් කරන ස්ථානයේ ලිපිනය හා හඳුනා ගැනීමේ විස්තරය* | *ග්‍රාම නිලධාරි වසම* |
|---|---|---|---|
| මොහොමඩ් සිද්දික් මොහොමඩ් සාජහාන් (ජා. හැ. අංක 732582916 V) අංක 2/1, උගුරැස්ස පිටිය කටුගස්තොට (බදුගැනුම්කරු) | මොහොමඩ් නවුර් පිච්චෙයි (ජා.හැ.අංක 563380268 V) අංක 08, උගුරැස්සපිටිය , කටුගස්තොට (බදුදීමනාකරු) | අංක 08, උගුරැස්සපිටිය, කටුගස්තොට කුළුගම්මන පාරේ දකුණු පැත්තේ වහාබ් මහතාට අයත්ව තිබූ වරිපනම් බදු අංක 84 සහ 88 දරන කඩකාමර අතර පිහිටි වරි/බදු අංක 86 දරන කඩ කාමරය | උගුරැස්සපිටිය |

ඩී. ජී. එම්. බී. රණසිංහ,
ලේකම්,
හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව.

03-610

# විවිධ දැන්වීම්

## මහ නගර සභාව - බදුල්ල

### කසල බදු අය කිරීම

ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව ඌව පළාත් සභාව විසින් අංක 1778/45 හා 2012 ඔක්තෝබර් මස 05 වැනි දින අති විශෙෂ ගැසට් පත්‍රය මගින් පළකර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාව 2014.02.21 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV ආ කොටස බදුල්ල මහ නගර සභාව වැළඳගෙන ඇත. ඒ අනුව පහත සඳහන් කසල බදු පනවන බව මෙයින් නිවේදනය කරමි.

#### උපලේඛනය

| කසල වර්ගය | දිනක් සඳහා බර (kg) | දිනක් සඳහා පරිමාව (l) | මාසික ගාස්තුව රු. ශත |
|---|---|---|---|
| දිරාපත් වන කසල | 5 - 9 | - | 1,000 0 |
| | 10 - 19 | - | 2,000 0 |
| | 20 - 39 | - | 3,000 0 |
| | 40 - 49 | - | 5,000 0 |
| | 50 | - | 10,000 0 |
| | 50 වැඩිවන සෑම 5 kg සඳහා) | - - | 500 0 |
| දිරාපත් නොවන කසල | - | 5-9 | 1,000 0 |
| | - | 10 - 19 | 2,000 0 |
| | - | 20 - 29 | 3,000 0 |
| | - | 30 - 49 | 5,000 0 |
| | - | 50 | 10,000 0 |
| | - | 50ට වැඩිවන සෑම 5L සඳහා | 500 0 |
| විද්‍යුත් අපද්‍රව්‍ය | 20 kg | මසකට | 1,000 0 |
| ගස් හා එහි කොටස් | කියුබ් 1ක් සඳහා | ප්‍රවාහනය කර භාරදීම සඳහා | 2,000 0 |
| පස් | කියුබ් 1ක් සඳහා | | 1,000 0 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | කියුබ් 1 ක් සඳහා | | 5,000 0 |

මහ නගර සභා ආඥාපනතේ 286 "අ" වගන්තිය යටතේ
බලයලත් නිලධාරී නාගරික කොමසාරිස්,
මහ නගර සභාව,
බදුල්ල.

2017 මාර්තු මස 01 වැනි දින,
බදුල්ල මහ නගර සභා කාර්යාලයේ දී ය.

03-804

**අක්මීමන ප්‍රාදේශීය සභාව**

ගලි බවුසර සේවාව ලබා ගැනීමේ දි අය කර ගන්නා ගාස්තු සංශෝධනය

පහත උපලේඛන 02 හි දැක්වෙන පරිදි සේවා සඳහා අය කරනු ලබන ගාස්තු 2017.01.01 දින සිට සංශෝධනය කිරීමට 2016.12.22 දින රැස් වූ මුදල් හා ප්‍රතිපත්ති කමිටුව තීරණය කළ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ටී. ජී. ඊසවතී,
ලේකම්,
අක්මීමන ප්‍රාදේශීය සභාව.

**උපලේඛන අංක 2**

| *නගර සභා සීමාව තුළ* | *ගාස්තුව (රු.)* |
|---|---|
| ගෘහ ස්ථානයකට ලෝඩ් 01 ක් සඳහා | 3000 |
| ඊට වැඩිවන සෑම එක් වාරයක් සඳහාම ලෝඩ් 01 ක් වෙනුවෙන් | 3000 |
| ව්‍යාපාර ස්ථානයකට ලෝඩ් 01 ක් සඳහා | 4000 |
| ඊට වැඩිවන සෑම එක් වාරයක් සඳහාම ලෝඩ් 01 ක් වෙනුවෙන් | 4000 |
| කර්මාන්ත ස්ථානයකට ලෝඩ් 01 ක් සඳහා | 4500 |
| ඊට වැඩිවන සෑම එක් වාරයක් සඳහාම ලෝඩ් 01 ක් වෙනුවෙන් | 4500 |
| සංචාරක හෝටලයකට/නේවාසිකාගාරයකට ලෝඩ් 01 ක් සඳහා | 6500 |
| ඊට වැඩිවන සෑම එක් වාරයක් සඳහාම ලෝඩ් 01 ක් වෙනුවෙන් | 6500 |
| ආගමික ස්ථානයකට/රජයේ අධ්‍යාපන ආයතනයකට ලෝඩ් 01 ක් සඳහා | 1000 |
| ඊට වැඩිවන සෑම එක් වාරයක් සඳහාම ලෝඩ් 01 ක් වෙනුවෙන් | 1000 |

* ප්‍රාදේශීය සභා සීමාවෙන් පිටත ඉහත එක් එක් ස්ථානයක් සඳහා අනුමත ගාස්තු මෙන් දෙගුණයකි.

* මෙම ගාස්තුවලට අමතරව ප්‍රවාහන වියදම් ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත ගෘහ ස්ථාන සඳහා කිලෝ මීටරයකට රු. 150 බැගින් හා එසේ නොවන සියලු ස්ථාන සඳහා කිලෝ මීටරයකට රු.200 බැගින් ද අය කෙරේ.

* ගලි බවුසර සේවාව සැපයීම සඳහා පරීක්ෂණ ගාස්තු ලෙස රු. 100 ක් අය කෙරේ.

* ගලි අපද්‍රව්‍ය රැගෙන විත් බැහැර කිරීම සඳහා ලෝඩ් 01 ක් වෙනුවෙන් රු. 1000 ක් අය කෙරේ.

*කොන්දේසි ඃ-*

* ආගමික ස්ථාන හා රජයේ අධ්‍යාපනික ආයතනවලට ලබා දීමේ දී හා යම් පුද්ගලයෙකුගේ ආර්ථික තත්වය සලකා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් සභාපතිතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ගාස්තු වලින් නිදහස් කිරීම හෝ සහන පදනම මත 50% අය කිරීමේ බලය ඇත.

* ගලි බවුසරය අප ආයතනයට ලබා දුන් හරිතගම ගම්වැසියනට මෙම සේවාව ගාස්තුවලින් නිදහස් කිරීම හෝ සහන පදනම මත 50% ක් අය කර ගැනීම සභාපතිතුමාගේ අනුමැතිය පරිදි සිදු කළ හැක.

03-400/2

---

**අක්මීමන ප්‍රාදේශීය සභාව**

පහත උපලේඛන 01 හි දැක්වෙන පරිදි සේවා සඳහා අය කරනු ලබන ගාස්තු 2017.01.01 දින සිට සංශෝධනය කිරීමට 2016.12.22 දින රැස් වූ මුදල් හා ප්‍රතිපත්ති කමිටුව තීරණය කළ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ටී. ජී. ඊසවති,
ලේකම්,
අක්මීමන ප්‍රාදේශීය සභාව.

උපලේඛන අංක 01

**සේවා සඳහා අය කරනු ලබන ගාස්තු සංශෝධනය**

| | | රු. ශත |
|---|---|---|
| 1. | ගොඩනැගිලි අයදුම් පත්‍රය | 500.00 |
| 2. | අනුබෙදුම් අයදුම් පත්‍රය | 300.00 |
| 3. | ජාතික ගොඩනැගිලි පර්යේෂණ ගාස්තු | 25.00 |
| 4. | වතුර බවුසරය බදුදීම (පැය 8 කට) | 3,000.00 |
| 5. | බහු කාර්ය ගොඩනැගිල්ල කුලියට දීම (දිනකට) | 2,000.00 |
| 6. | සමර්හට් කුලියට දීම (දිනකට) | 800.00 |
| 7. | වැඩිවන සෑම දිනකටම රු. 800 ක් අය කරනු ලැබේ. | |
| 8. | සභාව සතු පුටු කුලියට දීම (බාහිර අයට) පුටුවකට | 5.00 |
| 9. | බහු කාර්ය ගොඩනැගිල්ල සඳහා පුටුවකට | 5.00 |
| 10. | ශබ්ද විකාශන පද්ධතිය සඳහා (දිනකට) | 4,000.00 |
| 11. | ප්‍රොජෙක්ටරය බදු දීම | 4,000.00 |
| 12. | (තබා ගත හැකි උපරිම කාල සීමාව පැය 8 යි) | |
| 13. | පුස්තකාල පොත් ප්‍රමාද / දඩ ගාස්තු - | |
| | ළමා අංශය | 1.00 |
| | වැඩිහිටි අංශය | 2.00 |
| 14. | පෙර පාසල් ළමුන් ලියාපදිංචි කිරීමේ ගාස්තු | 500.00 |

03-400/1

---

**නැගෙනහිර මාන්තෛ ප්‍රාදේශීය සභාව**

තීරණ අංක 1 (1)

වෙළෙඳ කටයුතු සඳහා ගාස්තු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව පහත උපලේඛනයේ සඳහන් වෙළෙඳ කටයුතු සඳහා ගාස්තු පනවා අය කර ගැනීමට මාන්තෛ නැගෙනහිර ප්‍රාදේශීය සභාව තීරණය කරයි.

මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළවන දින සිට මාස තුනක කාලයක් ඇතුළත හා ඉන්පසු එළඹෙන සෑම වසරකම මාර්තු මස 31 වැනි දිනට පෙර මාන්තෛ නැගෙනහිර ප්‍රාදේශීය සභා කාර්යාලයේ ගෙවීම් කළ යුතු බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

පා. සිවපාල රාසා,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
නැගෙනහිර මාන්තෛ පාණ්ඩියන්කුලම්.

| | මහා පරිමාණ ව්‍යාපාර | නගර සභා බල ප්‍රදේශයෙන් පිට රු. ශත | නගර සභා බල ප්‍රදේශය තුළ රු. ශත |
|---|---|---|---|
| 01 | රන් ආභරණ වෙළෙඳසලක් පවත්වාගෙන යාම සඳහා | 3,000 0 | 3,000 0 |
| 02 | මුද්‍රණාලයක් පවත්වාගෙන යාම සඳහා | 750 0 | 1,000 0 |
| 03 | රෙදිපිළි වෙළෙඳසැලක් පවත්වාගෙන යාම සඳහා | 750 0 | 1,000 0 |
| 04 | භෝජනාගාරයක් හා තේපැන් සලක් සඳහා | 750 0 | 1,000 0 |
| 05 | කුළුබඩු වෙළෙඳසලක් සඳහා | 750 0 | 1,000 0 |
| 06 | ධාන්‍යාගාරයක් පවත්වාගෙන යාම සඳහා | 750 0 | 1,000 0 |
| 07 | දුම්වැටි විකිණීම හා ගබඩා කිරීම සඳහා | 750 0 | 1,000 0 |
| 08 | හෝටලයක් පවත්වාගෙන යාම සඳහා | 3,000 0 | 3,000 0 |
| 09 | කෘතීම පොහොර හා රසායන ද්‍රව්‍ය ගබඩා කිරීම හා විකිණීම සඳහා | 750 0 | 1,000 0 |
| 10 | රූපලාවන්‍ය ද්‍රව්‍යයන් ගබඩා කිරීම හා විකිණීම සඳහා | 750 0 | 1,000 0 |
| 11 | ටයර් හා ටියුබ් විකිණීම සඳහා | 750 0 | 1,000 0 |
| 12 | සිසිල් කළ බීම වර්ග විකිණීම සඳහා | 750 0 | 1,000 0 |
| 13 | බේකරියක් පවත්වාගෙන යාම සඳහා | 3,000 0 | 3,000 0 |
| 14 | ආපන ශාලාවක් පවත්වාගෙන යාම සඳහා | 750 0 | 1,000 0 |
| 15 | තීන්ත වර්ග විකිණීම හා ගබඩා කිරීම සඳහා | 750 0 | 1,000 0 |
| 16 | කරවල විකිණීම හා ගබඩා කිරීම සඳහා | 750 0 | 1,000 0 |
| 17 | පාවහන් වෙළඳ සලක් පවත්වාගෙන යාම සඳහා | 750 0 | 1,000 0 |
| 18 | ස්ටුඩියෝවක් පවත්වාගෙන යාම | 750 0 | 1,000 0 |
| 19 | ගුවන් විදුලි යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් සඳහා | 500 0 | 1,000 0 |
| 20 | ඔරලෝසු යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් සඳහා | 500 0 | 1,000 0 |
| 21 | හාල් මෝලක් පවත්වාගෙන යාම සඳහා | 750 0 | 1,000 0 |
| 22 | ගෝනි හා පරණ යකඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 1,000 0 |
| 23 | ගෘහ භාණ්ඩ වෙළෙඳසලක් පවත්වාගෙන යාම සඳහා | 750 0 | 1,000 0 |
| 24 | රටබීම හලක් පවත්වාගෙන යාම සඳහා | 1,000 0 | 3,000 0 |
| 25 | විද්‍යුත් හා යාන්ත්‍රික වැඩපළක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 1,000 0 |
| 26 | යතුරුපැදි හා වාහන විකුණුම් ස්ථානයක් පවත්වාගෙන යාමසඳහා | 750 0 | 1,000 0 |
| 27 | මහන මැෂින් විකුණුම් සලක් පවත්වාගෙන යාම සඳහා | 1,000 0 | 1,000 0 |
| 28 | වාහන සෝද ස්නේහනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 1,000 0 | 1,000 0 |
| 29 | අයිස්ක්‍රීම් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් සඳහා | 3,000 0 | 3,000 0 |
| 30 | ලැගුම්හල් හෝ සංචාරක නිවාස පවත්වාගෙන යාම සඳහා | 3,000 0 | 3,000 0 |
| 31 | රා තැබෑරුමක් පවත්වාගෙන යාම සඳහා | 3,000 0 | 3,000 0 |
| 32 | අරක්කු තැබෑරුමක් පවත්වාගෙන යාම සඳහා | 3,000 0 | 3,000 0 |
| 33 | ලී මෝලක් (යන්ත්‍ර සහිත) සඳහා | 750 0 | 1,000 0 |
| 34 | මිනී පෙට්ටි සාප්පුවක් සඳහා | 500 0 | 1,000 0 |
| 35 | ඇඹරුම්හලක් පවත්වාගෙන යාම සඳහා | 750 0 | 1,000 0 |
| 36 | විදුලියෙන් හෝ ගෑස් මගින් කරන කර්මාන්තයක් සඳහා | 750 0 | 1,000 0 |
| 37 | ලියවන පට්ටලයක් සඳහා | 750 0 | 1,000 0 |
| 38 | විනාකිරි නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් සඳහා | 750 0 | 1,000 0 |
| 39 | උළු හා ගඩොල් විකිණීමේ ස්ථානයක් සඳහා | 750 0 | 1,000 0 |
| 40 | හඳුන්කූරු විකිණීමේ ස්ථාකයක් සඳහා | 750 0 | 1,000 0 |
| 41 | අමතර කොටස් හා යන්ත්‍ර කොටස් විකිණීමේ ස්ථානයක් සඳහා | 750 0 | 1,000 0 |
| 42 | යන්ත්‍ර මගින් පවත්වාගෙන යාම සඳහා | 750 0 | 1,000 0 |
| 43 | ඉංග්‍රීසි ඖසුහලක් පවත්වාගෙන යාම සඳහා | 750 0 | 1,000 0 |
| 44 | ශබ්ද පටිගත කිරීමේ ස්ථානයක් සඳහා | 750 0 | 1,000 0 |
| 45 | දුරකථන සන්නිවේදන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 750 0 | 1,000 0 |
| 46 | නියෝජිත තැපැල්හලක් පවත්වාගෙන යාම සඳහා | 750 0 | 1,000 0 |
| 47 | කිරි එකතු කිරීමේ හා විකිණීමේ ස්ථානයක් සඳහා | 750 0 | 1,000 0 |
| 48 | කුකුලමස් වෙළෙඳසලක් සඳහා | 750 0 | 1,000 0 |
| 49 | ගෘහ උපකරණ විකිණීමේ ස්ථානයක් සඳහා | 750 0 | 1,000 0 |
| 50 | වාහන සඳහා තීන්ත ගෑමේ ස්ථානයක් සඳහා | 750 0 | 1,000 0 |

| | මහා පරිමාණ ව්‍යාපාර | නගර සභා බල ප්‍රදේශයෙන් පිට රු. ශත | නගර සභා බල ප්‍රදේශය තුළ රු. ශත |
|---|---|---|---|
| 51 | ඉලෙක්ට්‍රොනික් උපකරණ විකිණීමේ ස්ථානයක් සඳහා | 3,000 0 | 3,000 0 |
| 52 | මාළු වෙළෙඳසලක් සඳහා | 750 0 | 1,000 0 |
| 53 | තල් ආශ්‍රිත නිෂ්පාදන භාණ්ඩ විකිණීමේ හලක් සඳහා | 750 0 | 1,000 0 |
| 54 | ඇස් කණ්නාඩි සලක් පවත්වාගෙන යාම සඳහා | 750 0 | 1,000 0 |
| 55 | රබර් මුද්‍රා සෑදීමේ වැඩපළක් සඳහා | 750 0 | 1,000 0 |
| 56 | පොල් පරාල හා සාප්පු ලෑලි විකිණීමේ ස්ථානයක් සඳහා | 750 0 | 1,000 0 |
| 57 | වතුර පොම්ප විකිණීම සඳහා | 750 0 | 1,000 0 |
| 58 | කිරිපිටි, බිස්කට් වෙළෙඳසලක් සඳහා | 750 0 | 1,000 0 |
| 59 | පිරවුම් හලක් සඳහා | 3,000 0 | 3,000 0 |
| 60 | පාර්සල් ප්‍රවාහනය කිරීම සඳහා | 750 0 | 1,000 0 |
| 61 | යකඩ ගෘහ භාණ්ඩ වෙළෙඳසලක් සඳහා | 750 0 | 1,000 0 |
| 62 | ජංගම දුරකථන වෙළෙඳසලක් සඳහා | 750 0 | 1,000 0 |
| 63 | උළු හා ඇස්බැස්ටස් ෂීට් වෙළෙඳසලක් සඳහා | 750 0 | 1,000 0 |
| 64 | සත්ව ආහාර වෙළෙඳසලක් සඳහා | 750 0 | 1,000 0 |
| 65 | පොල් තෙල් මෝලක් පවත්වාගෙන යාම සඳහා | 750 0 | 1,000 0 |
| 66 | රියැදුරු පාසලක් පවත්වාගෙන යාම සඳහා | 750 0 | 1,000 0 |
| 67 | සිනමා ශාලාවත් සඳහා | 750 0 | 1,000 0 |
| 68 | නාම පුවරු හා දැන්වීම් පුවරු නිෂ්පාදනය සඳහා | 750 0 | 1,000 0 |
| 69 | උත්සව ශාලාවක් පවත්වාගෙන යාම සඳහා | 750 0 | 1,000 0 |
| 70 | නයිලෝන් හා කපු වෙළෙඳසලක් සඳහා | 750 0 | 1,000 0 |
| 71 | කොහු හෝ කොහු ආශ්‍රිත භාණ්ඩ විකිණීම සඳහා | 750 0 | 1,000 0 |
| 72 | නිමි ඇඳුම් ගබඩා කිරීමේ ස්ථානයක් සඳහා | 750 0 | 1,000 0 |

| | කුඩා පරිමාණ ව්‍යාපාර | නගර සභා බල ප්‍රදේශයෙන් පිට රු. ශත | නගර සභා බල ප්‍රදේශය තුළ රු. ශත |
|---|---|---|---|
| 01 | පාපැදි අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් සඳහා | 750 0 | 1,000 0 |
| 02 | එළවළු හා පළතුරු විකුණුම් ස්ථානයක් සඳහා | 750 0 | 1,000 0 |
| 03 | සැලූනයක් පවත්වාගෙන යාම සඳහා | 750 0 | 1,000 0 |
| 04 | රණ් ආභරන වැඩපළක් සඳහා | 750 0 | 1,000 0 |
| 05 | බෙලෙක් තහඩු වැඩපළක් සඳහා | 750 0 | 1,000 0 |
| 06 | පුවත්පත් හා මාසික සඟරා විකුණුම් ස්ථානයක් සඳහා | 750 0 | 1,000 0 |
| 07 | යකඩ වැඩපලක් සඳහා | 750 0 | 1,000 0 |
| 08 | දුම්කොළ හා බුලත් ගබඩා කිරීමේ ස්ථානයක් සඳහා | 750 0 | 1,000 0 |
| 09 | ගල්වලින් සාදන ලද භාණ්ඩ වෙළෙඳසලක් සඳහා | 750 0 | 1,000 0 |
| 10 | පොල් ගබඩා කිරීමේ ස්ථානයක් සඳහා | 750 0 | 1,000 0 |
| 11 | වඩු වැඩපලක් සඳහා | 750 0 | 1,000 0 |
| 12 | තේ පැන් සලක් සඳහා | 750 0 | 1,000 0 |
| 13 | කුඹල් කර්මාන්තය හා වෙළෙඳසලක් සඳහා | 750 0 | 1,000 0 |
| 14 | ලොන්ඩ්‍රියක් සඳහා | 750 0 | 1,000 0 |
| 15 | ටයර් හා ටියුබ් වෝල්කනයිස් කිරීමේ ස්ථානයක් සඳහා | 750 0 | 1,000 0 |
| 16 | දැව හා දුර විකිණීමේ ස්ථානයක් සඳහා | 750 0 | 1,000 0 |
| 17 | බැටරි චාර්ජ් කිරීමේ ස්ථානයක් සඳහා | 750 0 | 1,000 0 |
| 18 | දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සඳහා | 750 0 | 1,000 0 |
| 19 | ඇඳුම් මැසීමේ කර්මාන්තයක් සඳහා | 750 0 | 1,000 0 |
| 20 | ඡායා පිටපත් යන්ත්‍ර කුළියට දීම සඳහා | 750 0 | 1,000 0 |
| 21 | ඡායා පිටපත් සේවාව සඳහා | 750 0 | 1,000 0 |
| 22 | මල්, ගඩොල් වෙළෙඳාම සඳහා | 750 0 | 1,000 0 |
| 23 | වාහන කුළියට දීම සඳහා | 750 0 | 1,000 0 |
| 24 | පූජා භාණ්ඩ වෙළෙඳසලක් සඳහා | 750 0 | 1,000 0 |

## නැගෙනහිර මාන්තෙ ප්‍රාදේශීය සභාව

### වෘත්තීය බදු

පහත සඳහන් වෘත්තිකයන් සඳහා 2017.01.01 වැනි දින සිට රු. 3,000ක මුදලක් හිමිකම් ගාස්තුවක් වශයෙන් අය කරනු ලැබේ. මෙය ජාතිය ගොඩනැගීමේ බද්ද හා එකතු කළ අගය මත බද්ද මෙයට ඇතුළත් නොවේ.

පා. සිවපාල රාසා,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
නැගෙනහිර මාන්තෙ,
පාණ්ඩියන්කුලම්.

1. මුදල් ණයට දීම.
2. රන් ආභරණ උකසට ගැනීම.
3. වෙන්දේසි කිරීම්.
4. රජයෙන් මුදල් නොලබා අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම.
5. ගොඩනැගිලි ද්‍රව්‍ය හා මාර්ග තැනීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සැපයීමේ කොන්ත්‍රාත්තුව.
6. තැරැව්කරුවන්.
7. නීත උපදෙස් ලබාදීම (නීතීඥවරු).
8. නොතාරිස් වෘත්තීය සඳහා.
9. පුද්ගලික වෛද්‍ය වෘත්තීය සඳහා.
10. පුද්ගලික බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම.
11. පුද්ගලික රෝහලත් පවත්වාගෙන යමා.
12. පොදු වෙළෙඳ කටයුතු.
13. බලපත්‍ර ලත් මිනින්දෝරු සහ සැලසුම් ශිල්පීය, ගොඩනැගිලි ශිල්පීය වෘත්තීන්.
14. ප්‍රවාහන ඒජන්සි.
15. ආදායම් බදු උපදේශක.
16. ප්‍රචාරක දැන්වීම් නියෝජිත වෘත්තීය.
17. රැකීරක්ෂා නියෝජිතයන්.
18. පුද්ගලික වාහන රියැදුරු පාසල්.
19. විදුලි කාර්මික වෘත්තීය.
20. යන්ත්‍ර සූත්‍ර කාර්මික වෘත්තීය.
21. අවමංගල්‍ය අධ්‍යක්ෂකවරු.
22. ගණකාධිකාරීවරුන්.
23. විගණකාධිවරුන්.

---

03 - 935/2

## නැගෙනහිර මාන්තෙ ප්‍රාදේශීය සභාව

මාන්තෙ නැගෙනහිර ප්‍රාදේශීය සභාව විසින් අයකරගනු ලබන පහත සඳහන් අයදුම් පත්‍ර සඳහා ගාස්තු, පුස්තකාල ගාස්තු, මස් සඳහා සතුන් ඝාතනය කිරීමේ ගාස්තු, අනෙකුත් කුළී හා බදු එකතු කළ අගය මත බද්දට හා ජාතිය ගොඩනැගීමේ බද්දට ඇතුළත් නොවේ.

| | | රු. | ශත |
|---|---|---|---|
| 1. | ත්‍රිරෝද රථ ලියාපදිංචි ගාස්තු - වසරකට | 300 | 0 |
| 2. | ගොඩනැගිලි සැලැස්ම සහතික කිරීම සඳහා අයදුම්පත්‍ර ගාස්තු | 250 | 0 |
| 3. | ගෙ වැදීම හා තහවුරු කිරීමේ සහතිකයක් සඳහා | 500 | 0 |
| 4. | වීථිරේඛා සහතිකයක් සඳහා | 1,000 | 0 |
| 5. | ප්‍රාදේශීය සභාව සතු පාරක් ඔස්සේ බොරළු, වැලි ප්‍රවාහනය කිරීම සඳහා අවසර පත්‍ර ගාස්තු | 70 | 0 |

| | | රු. ශත |
|---|---|---|
| 6. | ගව ඝාතනය සඳහා (එක සතෙකුට) | 670 0 |
| 7. | නල ජල ලබාගැනීමේ දී පාරේ අගල් කපන අවස්ථාවක දී එය අලුත්වැඩියා කිරීමේ ගාස්තු තාර පාරේ මීටරයකට | 1,500 0 |
| 8. | වැඩ බිමක් මගින් දෙනු ලබන ටෙන්ඩර් පත්‍රිකාවක් සඳහා | 1,000 0 සිට 2,000 0 |
| 9. | ආදායම් ඒකකයක් මගින් නිකුත් කරනු ලබන ටෙන්ඩර් පත්‍ර සඳහා | 1,000 0 |
| 10. | පුස්තකාල සාමාජික ගාස්තු | 100 0 |
| 11. | පුස්තකාල සාමාජිකත්වය අලුත් කිරීම සඳහා ගාස්තු | 100 0 |
| 12. | දැන්වීම් පුවරු සඳහා ගාස්තු - වර්ග අඩියකට | 50 0 |
| 13. | නිදැල්ලේ හැසිරෙන ගවයෙකු ඇල්ලීම සඳහා | 500 0 |
| | දඩය | 1,000 0 |
| | දිනකට නඩත්තු කිරීමේ ගාස්තු | 250 0 |
| 14. | පුස්තකාල නැවත භාරදීමේදී ඇතිවන ප්‍රමාදයන් සඳහා දවසකට | 1 0 |
| 15. | පා පැදියක් සඳහා බලපත්‍ර ගාස්තු අවුරුද්දක් සඳහා | 25 0 |
| 16. | ට්‍රැක්ටරයක් සමග ජල ටැංකියක් (ලීටර් 4000ක්) පුද්ගලයෙකුට හෝ ආයතනයකට සේවා සැපයීම සඳහා දවසකට පැය 8කට | 5,600 0 |
| 17. | ජල ටැංකියකට පමණක් (ලීටර් 4000ක්) | 1,500 0 |
| 18. | නිවසේ ඇතිකරන සුනඛයෙකුගේ කරපටියක්, තහඩුවක් නිකුත් කිරීම | 100 0 |
| 19. | උත්සව සමයේ දී පමණක් වෙළෙඳාම සඳහා ලාච්චම් 10ක බිම් ප්‍රමාණයකට දිනකට | 500 0 |
| 20. | වාහනයක් භාවිතා කරමින් කරනු ලබන ප්‍රකාශන වැඩසටහනකට හෝ වෙළෙඳාමකට | 500 0 |
| 21. | පොදු ස්ථානයක වාහනයක් නවතා තබාගෙන කරනු ලබන දැන්වීම් වැඩසටහනක් සඳහා දිනකට | 500 0 |
| 22. | මෝටර් - ග්‍රේඩර් - ඒකකයක් එවීම සඳහා | 4,200 0 |
| 23. | රෝලයරයක් - ඒකකයක් එවීම සඳහා කුළිය | 3,000 0 |
| 24. | ට්‍රැක්ටර් යන්ත්‍රයක් - දිනකට කුළිය | 4,300 0 |

පා. සිවපාල රාසා,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
නැගෙනහිර මාන්තෙෙ,
පාණ්ඩියන්කුලම්.

03 . 935/3

---

## නැගෙනහිර මාන්තෙෙ ප්‍රාදේශීය සභාව

තීරණ අංක 03

පහත සඳහන් පරිදි අපද්‍රව්‍ය, ඉවත් කිරීම සඳහා ගාස්තු අයකිරීමට ප්‍රාදේශීය සභාව තීරණය කර ඇත. මෙයට ජාතිය ගොනැගීමේ බද්ද හා අගය මත එකතු කිරීමේ බද්ද ඇතුළත් නොවේ:

1. වැසිකිළි වලෙන් අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා ගාස්තු.
2. අපවිත්‍ර ජලය ඉවත් කිරීම සඳහා ගාස්තු : ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් පිට කිලෝමීටරයකට රු. 1,000 බැගින් අය කෙරේ.

පා. සිවපාල රාසා,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
නැගෙනහිර මාන්තෙෙ,
පාණ්ඩියන්කුලම්.

03 - 935/4

## නැගෙනහිර මාන්තෙ ප්‍රාදේශීය සභාව

තීරණ අංක 04

**පොදු තීරණය**

අගය මත එකතුකළ බද්ද හා ජාතිය ගොඩනැගීමේ බද්ද මෙයට ඇතුළත් නොවේ.

(1) 2017.01.01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි මාන්තෙ ප්‍රාදේශීය සභාව යටතේ පාලනය වන එළවළු වෙළෙඳපොළේ සිට මීටර් 500ක් ඇතුළත පෞද්ගලිකව කිසිවෙකු විසින් එළවළු වෙළෙඳාම් කිරීම තහනම් කර ඇත.

(2) 2017.01.01 වැනි දින සිට සන්නිවේදන කුළුනක් සඳහා ගාස්තු

(අ) මීටර් 20කට වඩා උස කුළුනක් සඳහා වසරකට රු. 3,000.
(ආ) උස මීටර් 20කට වඩා කුළුනක් සඳහා වසරකට රු. 2,000.

(3) කොන්ත්‍රාත්කරු විසින් ප්‍රාදේශීය සභාවේ වැඩ සඳහා බොරලු සැපයීමේ දී ට්‍රැක්ටරයකට රු. 250 බැගින් ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතුයි.

(4) නියෝජිතයින් මගින් කොන්ත්‍රාත්කරුවන්ට බොරළු සැපයීමේ දී ට්‍රැක්ටරයකට රු. 100 බැගින් වූ ගාස්තුවක් අය කෙරේ.

පා. සිවපාලරාසා,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
නැගෙනහිර මාන්තෙ,
පාණ්ඩියන්කුලම්.

03 - 935/5

---

## නැගෙනහිර මාන්තෙ ප්‍රාදේශීය සභාව

තීරණ අංක - 05

ප්‍රාදේශීය සභාව විසින් ඉදිකරනු ලැබූ මාර්ගවල ටොන් 3කට වඩා වැඩි බර වාහනයක් ගමන් කිරීම සඳහා මාන්තෙ ප්‍රාදේශීය සභාවේ අනුමැතිය ලබාගත යුතු අතර අලුත්වැඩියා සඳහා ගාස්තු ද ගෙවිය යුතුයි. එකතු කළ අගය මත බද්ද හා ජාතිය ගොඩනැගීමේ බද්ද ඇතුළත් නොවේ.

පා. සිවපාල රාසා,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
නැගෙනහිර මාන්තෙ,
පාණ්ඩියන්කුලම්.

03-935/6

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.